### ඇටෝර්නි බලය අවලංගු කිරීම

පිළියන්දල, මාම්පේ. විශ්වකලා පාර, අංක 130/10/B හි පදිංචි පොරගන්නා ගෙදර නිහාල් සිරිවංශ (ජැ.හැ.අ. 491682982V) වන අය විසින් ප්‍රසිද්ධ නොතාරිස් ආර්. ඩී. බන්දුල මහතා සහතික කළ අංක 1510 සහ වර්ෂ 2019 සැප්තැම්බර් මස 06 දිනැති ඇටෝර්නි බලපත්‍රයෙන් ගාල්ල, චීනකොරටුව, සිරි දේවාමිත්ත මාවත, අංක 10හි පදිංචි මුණසිංහ පතිරණ පල්ලියගේ තීක්ෂණ නවීන් මධුෂංක (ජා.හැ.අ. 873522062 V) යන අයට දෙනු ලැබූ ඇටෝර්නි බලය, ඇටෝර්නි අධිපති 2019.09.10 වැනි දින මියගිය හෙයින් ඇටෝර්නි අධිපතිගේ නීත්‍යානුකූල උරුමකාරියවූ ද, නීතිඥ හා නොතාරිස් අශෝක ධර්මරත්න මහතාගේ වර්ෂ 2021ක් වූ ජනවාරි මස 28 දිනැති අංක 274 දරන ප්‍රොබේට් පැවරුම්කරය මත ජාසිං ආරච්චිගේ චන්දි සුබෝධිකා (ජා.හැ.අ. 688162777 V) වන මා විසින් ඉහත කී ඇටෝර්නි බලපත්‍රය අවලංගු කර බලරහිත කරන බව ශ්‍රී ලංකා ජනරජයට සහ ශ්‍රී ලංකාවාසී සියලු දෙනාම මෙයින් දැනගත යුතුය.

ජාසිං ආරච්චිගේ චන්දි සුබෝධිකා (ජා.හැ.අ. 688162777 V)
(මියගිය ඇටොර්නි අධිපතිගේ නීත්‍යානුකූල උරුමකාරිය සහ එම මියගිය අයගේ බූදලයේ ප්‍රොබේට් පැවරුම්ලාභිණිය)

07 - 410/1

---

### ඇටෝර්නි බලය අවලංගු කිරීම

කොළඹ 05, පූර්වාරාම පාර, අංක 42 දරන ස්ථානයේ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය පවත්වාගෙන යනු ලබන වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සමාගමක් ලෙස ලියාපදිංචි කරන ලද ලියාපදිංචි අංක PV 74748 හිමි COLLETTES ENTERPRISES CLEANING SERVICE (PRIVATE) LIMITED) (කොලෙට්ස් එන්ටප්‍රයිසස් ක්ලීනින් සර්විස් ප්‍රයිවට් ලිමිටඩ්) නමැති සමාගම විසින් ප්‍රසිද්ධ නොතාරිස් ආර්. ඩී. බන්දුල මහතා සහතික කළ අංක 1511 සහ වර්ෂ 2019 සැප්තැම්බර් මස 06 දිනැති විශේෂ ඇටෝර්නි බලපත්‍රයෙන් ගාල්ල චීනකොටුව, සිරි දේවාමිත්ත මාවත, අංක 10හි පදිංචි මුණසිංහ පතිරණ පල්ලියගේ තීක්ෂණ නවීන් මධුෂංක (ජා.හැ.අ. 873522062 V) යන අයට දෙනු ලැබූ ඇටෝර්නි බලය, එකී සමාගමේ සභාපතිණිය/ අධ්‍යක්ෂවරිය ලෙස සහ COLLETTES ENTERPRISES CLEANING SERVICE (PRIVATE) LIMITED සමාගමෙහි වර්තමාන හිමිකාරීත්වය සහ නීතිඥ හා නොතාරිස් අශෝක ධර්මරත්න මහතාගේ වර්ෂ 2021 ක් වූ ජනවාරි මස 28 දිනැති අංක 274 දරන ප්‍රොබේට් පැවරුම්කරය මත ජාසිං ආරච්චිගේ චන්දි සුබෝධිකා (ජා.හැ.අ. 688162777 V) වන මා විසින් ඉහත කී ඇටෝර්නි බලපත්‍රය අවලංගුකර බලරහිත කරන බව ශ්‍රී ලංකා ජනරජයට සහ ශ්‍රී ලංකාවාසී සියලු දෙනාම මෙයින් දැනගත යුතුය.

ජාසිං ආරච්චිගේ චන්දි සුබෝධිකා (ජා.හැ.අ. 688162777 V)
COLLETTES ENTERPRISES CLEANING SERVICE (PRIVATE) LIMITED (කොලෙට්ස් එන්ටප්‍රයිසස් ක්ලීනින් සර්විස් ප්‍රයිවට් ලිමිටඩ්) නමැති සමාගමේ සභාපතිණිය/අධ්‍යක්ෂවරිය සහ ප්‍රොබේට් බලපත්‍ර පැවරුම්ලාභිණිය)

07- 410/2

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.